## අතුරලිය ප්‍රාදේශීය සභාව.
## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජූලි 22 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව අතුරලිය ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට අතුරලිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2005 දෙසැම්බර් 01 දිනැති අංක 1421/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අතුරලිය ප්‍රාදේශීය සභාව ස්ථාපනය කර තිබුණද 2011 ජූලි 26 දින වන විටත් අකුරැස්ස ප්‍රාදේශීය සභාව සහ අතුරලිය ප්‍රාදේශීය සභාව අතර වත්කම් හා වගකීම් බෙදාහැරීම් නිරවුල් කර නොතිබුණි.

(ආ) රු.4,920,981 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තුල ඉඩම් කට්ටි 10 ක වටිනාකම් නිසි තක්සේරු කිරීමකින් තොරව ගිණුම්ගත කිරීම හේතුවෙන ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඇ) 2010 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, රු.5,028 ක් වටිනා පොත් 34 ක ඌණතාවයක් නිරීක්ෂණය වූ අතර එකී අගය ගිණුම් වල ගැලපුම් කර නොතිබුණි.

(ඈ) පරිග්‍රහණ ලේඛණයට අනුව පුස්තකාල පොත්වල වටිනාකම රු.513,383 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.514,723 ක් වූයෙන් වෙනස රු.1,340 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට අංක 117-01-001-2- 7906583 දරණ බැංකු ගිණුමේ ස්ථාවර නියෝග යටතේ කර තිබූ ගෙවීම් හා ඊට අදාල ගාස්තු රු.61,281 ක් වියදමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්.

(අ) ගිණුම් විෂයයන් දෙකකට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.1,878,626 ක් වූ අතර උපයෝගී ලේඛණ අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.1,856,716 ක් වූයෙන් වෙනස රු.21,910 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් විෂයයන් 04 ක ගිණුම් වලට අදාල ලේඛණ අනුව හිඟ මුදලත්, ප්‍රා.ස. 07 වාර්තාව අනුව හිඟ මුදලත් අතර රු. 222,048 ක වෙනසක් තිබූ බව නිරීක්ෂණය විය.

1.3.3 ගෙවිය යුතු ගිණුම්.

(අ) 2006 වර්ෂයේ සිට පැවත එන රු.68,554 ක් වූ ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 කාලයක් ඉක්ම වූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.4,922,011 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

ගිණුම් විෂයයන් 04 කට අයත් රු.27,534,337 ක වටිනා ශේෂයන් සඳහා ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ, උපලේඛණ ආදිය නොමැතිකමින් එකී විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 148 | ප්‍රා.ස. 13,15,19 ආකෘති ඇතුලත් ලේඛණ සකස් කර නොතිබුණි. |
| (ii) රීති 164 | සභාවේ ගිණුම් ලියකියවිලි ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දිනපතා පරීක්ෂා කර ඒ බවට කෙටි අත්සන් තැබීම මගින් තහවුරු කර නොතිබුණි. |
| (iii) රීති 180 - 184 | සභාවේ මුදල්, ගබඩා හා වත්කම් භාරව කටයුතු කරන සේවකයින් නිලධාරීන් ඇප තැබීම් කර නොතිබුණි. |
| (iv) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි සත්‍ය ශේෂය සසඳා අතිරික්ත හා ඌණතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) රීති 217 - 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කළ |

යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා එසේ කර නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,576,953 ක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 4,708,556 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, හා තථ්‍ය ආදායම් පිළිබඳ සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ ආදායම් තත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | 2010 | 2009 | % | % |
| | රු. | රු. | | |
| වරිපනම් | 360,763 | 103,008 | 250.2 | - |
| අක්කර බදු | 19,345 | 87,148 | - | 77.8 |
| බදු කුලී | 42,563 | 393,738 | - | 89.19 |

2.2.2 හිඟ බදු හා ගාස්තු

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාලව අයවිය යුතු රු.310,108 ක බදු හා ගාස්තු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ මුදල

විවිධ ආඥාපනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයකින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා තිබූ රු.149,200 ක් වූ දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් රු.93,933 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 7,716 | 7,835 | (119) | 7,584 | 6,928 | 656 |
| අනෙකුත් | 3,705 | 3,185 | 520 | 3,348 | 2,804 | 544 |
| උප එකතුව | 11,421 | 11,020 | 401 | 10,932 | 9,732 | 1,200 |
| ප්‍රාග්ධන වියදම | 10,374 | 23,287 | (12,913) | 10,100 | 17,555 | (7,455) |
| මුළු එකතුව | 21,795 | 34,307 | (12,512) | 21,032 | 27,287 | (6,255) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය.

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 03 | 02 |
| ද්විතියික | 09 | 10 |
| ප්‍රාථමික | 15 | 11 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 09 |
| එකතුව | 27 | 32 |

(i) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්ය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා වූ වියදම රු.7,835,488 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ ඉන් රු.6,807,000 ක් පමණක් වූයෙන් සභාවට රු.1,028,488 ක අතිරේක වැය බරක් ඇති වී තිබුණි.

(ii) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතන වල අනියම්, ආදේශක, හා කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 09 ක් බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සහා අරමුදලින් රු.1,393,569 ක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිභවා යමින් බඳවා ගැනීම් සිදුකලහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය.

### 2.5.1 ලැබිය යුතු ගිණුම්.

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයක් ඉක්මවූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 90,475 ක් විය.

2.5.2 අයවීමට ඇති සේවක ණය.

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 1,418,101 ක් විය.

2.6 කාර්ය සාධනය.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) මන්ත්‍රීවරුන් 09 දෙනෙකුගෙන් සමන්විත සභාවේ 2010 වර්ෂයේ මන්ත්‍ර දීමනා ලෙසට රු.498,750 ක් ගෙවා තිබූ අතර වර්ෂයේ සභා රැස්වීම් 12 ටම සහභාගී වී තිබුණේ ඉන් මන්ත්‍රීවරුන් හතර දෙනෙකු පමණි.

(ii) 2010 වර්ෂයේ අයවැය ලේඛණයේ ප්‍රාග්ධන වියදම් යටතේ සභාවේ එක් එක් මන්ත්‍රීවරයාගේ යෝජනා ඇතුලත් කර වර්ෂයේ ඉටු කිරීමට යෝජිත වැඩ විස්තරයක් නොතිබුණි.

(iii) 2010 වර්ෂයේ අයවැය ලේඛණයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩ යෝජනා 55 ක ලැයිස්තුවක් වූ අතර ඒවායේ වටිනාකම දක්වා නොතිබුණි. අයවැය ලේඛණය අනුව ඉලක්ක කල ප්‍රාග්ධන වියදම රු.9,700,000 ක් වුවද ඉහත වැඩ යෝජනා වලින් 14 ක තථ්‍ය වියදම රු.7,083,917 ක් විය. තවද ඉලක්ක කල වැඩ යෝජනා 41 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය.

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන.

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.